NLB
ජාතික ලොතරැයිය

# ජාතික ලොතරැයි මණ්ඩලය

## මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය

# ඇබෑර්තු

ජාතික ලොතරැයි කර්මාන්තයේ පුරෝගාමියා වන ජාතික ලොතරැයි මණ්ඩලය 1963/11 මුදල් පනත යටතේ ස්ථාපිත මුදල් අමාත්‍යාංශය යටතේ සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වන සහ නියාමනය වන රාජ්‍ය ආයතනයක් වේ. ජාතික ලොතරැයි මණ්ඩලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා සුදුසුකම් ලත් අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| | | | |
|---|---|---|---|
| 1. | අලෙවි නිලධාරි | - | (තනතුරු 01) |
| 2. | ලොතරැයි ඇනවුම් නිලධාරි | - | (තනතුරු 01) |
| 3. | මහජන සම්බන්ධතා නිලධාරි | - | (තනතුරු 01) |
| 4. | මාධ්‍ය සම්බන්ධීකරණ නිලධාරි | - | (තනතුරු 01) |
| 5. | කලාප කළමනාකරු | - | (තනතුරු 01) |
| 6. | තොරතුරු තාක්ෂණ නිලධාරි | - | (තනතුරු 01) |
| 7. | පරිගණක ක්‍රමලේඛක | - | (තනතුරු 01) |

**සුදුසුකම් හා පළපුරුද්ද**

**1. අලෙවි නිලධාරි**

**බාහිර**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් අලෙවිකරණය / ව්‍යාපාර පරිපාලනය / වාණිජ කළමනාකරණය / කලා උපාධියක් හෝ වරලත් අලෙවිකරණ ආයතනයේ (CIM) / ශ්‍රී ලංකා අලෙවිකරණ ආයතනයේ (SLIM) පූර්ණ සුදුසුකම් ලැබීමෙන් පසුව අලෙවිකරණ ක්ෂේත්‍රයේ අවම වසර 02ක පළපුරුද්ද.

**2. ලොතරැයි ඇණවුම් නිලධාරි**

**බාහිර**

01. බලපත්‍රලාභී / ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ (ICASL) අන්තර්මධ්‍ය මට්ටමෙහි සුදුසුකම හෝ කළමනාකරණ ගණකාධිකාරීවරුන්ගේ වරලත් ආයතනය (CIA) හෝ සහතිකලත් හා ආයතනික ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ව්‍යාපාර පරිපාලනය / කළමනාකරණය හෝ වාණිජ උපාධිය හෝ ගණකාධිකරණය පිළිබඳ උසස් ජාතික ඩිප්ලෝමාව

**සහ**

රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළඳ ආයතනයක ගිණුම්කරණ සහ මූල්‍ය ක්ෂේත්‍රයේ සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වසර 02 ක පළපුරුද්ද.

**3. මහජන සම්බන්ධතා නිලධාරි**

**බාහිර**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජන සන්නිවේදනය / රාජ්‍ය පරිපාලනය / මානව සම්පත් පිළිබඳ උපාධියක් සමග සුදුසුකම් ලැබීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ පිළිගත් ආයතනයක අවම වසර 02 ක පළපුරුද්ද.

**4. මාධ්‍ය සම්බන්ධීකරණ නිලධාරි**

**බාහිර**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් ජන සන්නිවේදනය /අලෙවිකරණය / ප්‍රචාරණය / කලා (ජන මාධ්‍ය සන්නිවේදනය විෂයයක් ලෙස ඇතුළත් විය යුතුය.) පිළිබඳ උපාධිය / අලෙවිකරණය පිළිබඳ වෘත්තීය සුදුසුකම් (PQM) සමග සුදුසුකම් ලැබීමෙන් පසුව අදාළ ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර 02 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා තනතුරු අංක 01 සිට 04 දක්වා පහත කොන්දේසි අදාළ වේ.**

බාහිර සුදුසුකම් හෝ ජාතික ලොතරැයි මණ්ඩලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික නොවන කාණ්ඩයේ (MA 1-2) II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ අවම වසර 05 ක පළපුරුද්ද.

**5. කලාප කළමනාකරු**

**බාහිර**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධිය (අලෙවිකරණ / ව්‍යාපාර පරිපාලන / වාණිජ / කළමනාකරණය) සමග සුදුසුකම් ලැබීමෙන් පසු රජයේ දෙපාර්තමේන්තුවක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක හෝ වාණිජ ආයතනයක අදාළ ක්ෂේත්‍රයේ වසර 03 ක පළපුරුද්ද.

**අභ්‍යන්තර**

01. කළමනාකරණ සහකාර - තාක්ෂණ නොවන (MA 1-2) II ශ්‍රේණියේ අදාළ විෂය ක්ෂේත්‍රයේ අවම වශයෙන් වසර පහක (05) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**6. තොරතුරු තාක්ෂණ නිලධාරි**

**බාහිර / අභ්‍යන්තර**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබා ගත් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය සහ LAN/WAN/, Web Application, Network applications සහ Security System පිළිබඳ පුළුල් දැනුම, Application, Procedures සහ Techniques සහ C#, .Net, ASP.Net, SQL Server, Windows Server, Linux, Unix, HTML5, XML, Object Oriented Concept, DB Administration, Crystal Reports etc, පිළිබඳ සුදුසුකම් ලැබීමෙන් පසුව අවම වසර 03ක පළපුරුද්ද.
02. ජාතික ලොතරැයි මණ්ඩලයේ කළමනාකරණ සහකාර - තාක්ෂණික කාණ්ඩයේ (MA 2-2) II ශ්‍රේණියේ අදාළ ක්ෂේත්‍රයේ අවම වසර 05 ක පළපුරුද්දක් තිබිය යුතුය.

**අංක 01 සිට 06 දක්වා තනතුරු සඳහා පහත වයස් සීමාවන් සහ වැටුප් පරිමාණයන් අදාළ වේ.**

- වයස් සීමාව : අවුරුදු 22ත් – 45ත් අතර වීම.
  අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා වයස් සීමාව අදාළ නොවේ.
- වැටුප් පරිමාණය : JM 1-1 Rs: [72,650 – 10 x 1,360 – 18 x 2,040 = 122,970]
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

**7. පරිගණක ක්‍රමලේඛක**

**බාහිර / අභ්‍යන්තර**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් පරිගණක විද්‍යාව හෝ තොරතුරු තාක්ෂණය පිළිබඳව උපාධියක් සහ උපාධිය ලබා ගැනීමෙන් පසු ASP.Net, VB6,VC++,C#, Crystal report and SQL server back end වැනි ප්‍රධාන තාක්ෂණ ක්ෂේත්‍රයන් පිළිබඳ අවම වශයෙන් වසර 03ක පළපුරුද්ද .

- වයස් සීමාව : අවුරුදු 18ත් – 45ත් අතර වීම.
  අභ්‍යන්තර අපේක්ෂකයින් සඳහා වයස් සීමාව අදාළ නොවේ.
- වැටුප් පරිමාණය : MA 3 Rs:[53,940–10x 800 – 11 x 1,190 - 10 x 1,320 – 5 x 1,350 = 94,980]
  (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2025 අනුව මෙම වැටුප් පරිමාණය 2027.01.01 දින සිට ක්‍රියාත්මක වේ.)

තෝරාගත් අපේක්ෂකයින්ට වැටුපට අමතරව මාසික දිරි දීමනාවක්, වෛද්‍ය රක්ෂණ පහසුකම් සහ අනෙකුත් දීමනා හිමිවේ.

- ඉංග්‍රීසි භාෂාව පිළිබඳ දැනුම අතිරේක සුදුසුකමක් වනු ඇත.
- බඳවා ගැනීමේ පටිපාටිය,

  සියලු තනතුරු සඳහා ලිඛිත තරඟ විභාගයක් සහ/හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත පදනම් වේ.
- ලිඛිත තරඟ විභාගය,

  විභාගය සඳහා ඉදිරිපත් කරන විෂයයන් පහත දැක්වේ :
  - භාෂා ප්‍රවීණතාවය
  - යෝග්‍යතා පරීක්ෂණය
  - තනතුරට අදාළ විෂය දැනුම
  - ලිඛිත තරඟ විභාගයකින් සහ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් තෝරා ගනු ලැබුවහොත්, ලිඛිත විභාගයේදී ලබාගත් ලකුණු වලින් 60% සහ සම්මුඛ පරීක්ෂණයේදී ලබාගත් ලකුණු වලින් 40% එකතුවෙහි සමස්තය මත පදනම්ව කුසලතා අනුපිළිවෙලට අවසාන තේරීම සිදු කෙරේ.
  - ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් හරහා තෝරා ගනු ලැබුවහොත් – සම්මුඛ පරීක්ෂණයේදී කුසලතා අනුපිළිවෙළ අනුව පත්වීම් ලබා දෙනු ලබයි.

**සාමාන්‍ය කොන්දේසි**

- සියලුම අයදුම්කරුවන්,

i. ශ්‍රී ලාංකික පුරවැසියන් විය යුතුය.
ii. තනතුරේ රාජකාරි හොඳින් ඉටු කිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
iii. විශිෂ්ට සදාචාරාත්මක චරිතයකින් යුක්ත විය යුතුය.

- අයදුම්කරුවන් 2025.09.23 දිනට අදාළ සුදුසුකම් සපුරා තිබිය යුතුය.
- අයදුම් කරන තනතුර ලියුම් කවරයේ ඉහළ වම් කෙළවරේ සඳහන් කළ යුතුය.
- එක් තනතුරකට වඩා අයදුම් කරන්නේ නම්, එක් එක් තනතුර සඳහා වෙන වෙනම අයදුම්පත් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්පත් භාරගන්නා අවසන් දිනය 2025.09.23 වේ.
- අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පසුව ලැබෙන අයදුම්පත් නොසලකා හරින අතර, තැපැල හරහා මඟ හැරුණු අයදුම්පත් සඳහා ජාතික ලොතරැයි මණ්ඩලය කිසිදු වගකීමක් දරනු නොලැබේ.
- ඕනෑම ආකාරයක ප්‍රචාරණයක් නුසුදුසුකමක් ලෙස සලකනු ලැබේ.
- අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයේ තීරණය තීරණාත්මක වේ.
- මෙම දැන්වීම ජාතික ලොතරැයි මණ්ඩලයේ වෙබ් අඩවිය වන **www.nlb.lk** හි ද සඳහන් වේ.

**අයදුම් කරන ආකාරය**

- සෑම අයදුම්කරුවෙකුම තමන් විසින් සකස් කරන ලද අයදුම්පත් සමග අධ්‍යාපන සුදුසුකම්, වෘත්තීය සුදුසුකම්, සේවා පළපුරුද්ද, උප්පැන්න සහතික සහ සුදුසුකම් සනාථ කළ හැකි සේවා සහතික ඇතුළු සියලුම සහතිකවල සහතික කළ පිටපත් සහ ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ඉදිරිපත් කළ යුතුය.
- සම්පූර්ණ කරන ලද අයදුම්පත් අවසන් දිනට හෝ ඊට පෙර **සාමාන්‍යාධිකාරී, ජාතික ලොතරැයි මණ්ඩලය, අංක 32, දේශමාන්‍ය එන්. ඩබ්ලිව්. ජේ. මුදලිගේ මාවත, කොළඹ 01** යන ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය.
- ඉහත සඳහන් කරුණු වලට අනුකූල නොවන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.
- දැනටමත් රජයේ / රාජ්‍ය ආයතන / සංස්ථා / මණ්ඩලවල සේවයේ නියුතු අයදුම්කරුවන්, තම අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානියා හරහා යොමු කළ යුතුය.

**සභාපති,**
**ජාතික ලොතරැයි මණ්ඩලය,**
**අංක 32, දේශමාන්‍ය එන්.ඩබ්.ජේ. මුදලිගේ මාවත, කොළඹ 01.**

tamilguru.lk